# මිනිසෙකු විසින් දිය හැකි උතුම් ම දානය කුමක් ද?

මිනිසාගේ උපත ඇරැඹුණේ මවගෙන් ද පියාගෙන් ද යනු තරමක් විවාදාත්මක මැයෙකැයි මට හැඟේ. උපත ලද්දේ මවගෙන් යැ යනු කෙනෙකුට කියත හැකි වුවත්, මව වෙතට ජීවය ගියේ පියාගෙන් යැ යනු බැහැර කළ නොහැකි කරුණෙකි. සියලු කරුණු එක් රැස් කරැ සිතා, බලා මිනිස් කලලය හට ගත්තේ මවකගේ කුස තුළැදී යැයි අදහා ගැනීම විවාදයෙන් බැහැර බීමේ මඟ යැයි සිතේ.

මවකගේ කුස තුළැ පිළිසිඳ ගත් තැන් පටන්, මව් කුසින් බැහැර වැ එළිය දකින තෙක් ද, දෙපයින් නැඟී සිටැ දිවි ගමන අරඹන තෙක් ද දරුවෙකුට මවගෙන් ලැබෙන රැකවරණය මෙ පමණ යැයි තිර ලෙසැ පැවැසීම කළ නො හැකි මැ යැ. ඒ බව මැනැවින් සනාත වනුයේ සෑම දරුවෙකු මැ අන් හැම කෙනෙකුට වඩා මව වෙතැ තුරුලු වන හෙයිනි. මවගෙන් ලැබෙන මව් කිරි පොද නැතිවැ ද දරුවන් හැදී-වැඩෙන බව අප දනිතත්, දරුවෙකුට මව්කිරට වැඩි අහරක් මිහිපිට නැති බව නම් පිළිගත යුතු යැ.

පවුලෙකැ සියලු කටයුතු සදාචාරාත්මක වැ සිදු වේ නම්, දරුවෙකු හැදී, වැඩී රැකියාවකට යොමු වන තෙක් මැ මවගේ රැකැවරණ නැති වැ මැ බැරි බව සමාජය දකී. එහෙත්, හැදුණු-වැඩුණු දරුවන් හැම දෙනාට මැ මවගේ අගය එක ලෙසැ දැනුණු බවක් අපට නො පෙනේ. සිය මවට අහර පිඩක් නො දී, නිවසින් පිටමං කරන දරුවන් ගැන පුවත්පත්වලැ සඳහන් වී තිබේ. මව ගේ වදන් පිටිකන් යවා සිය කැමත්ත අනු වැ සහකාරියන් තෝරා ගෙනැ, පවුල්වලින් බැහැර වූ දරුවන් අපමණ යැ. එවන් කිසි මැ තැනෙක දී ''මේ මට උපත දුන් අම්මා නේද?'' යන හැඟුම ඉස්මතු වූයේ නැත.

මිනිස් සමාජයට නීති පද්ධතියක් සපයන අවධියෙහි දී සියලු මානසික කරුණු කෙරෙහි එක සේ සැලැකිලිමත් වී තිබේද යනු සැක සහිත යැ. අප දන්නා පරිදි පියෙකු විසින් හදා-වඩා නො ගන්නා බාල වයස්කාර දරුවනට උසාවියේදී ඇතැම් සහන සලසා ඇති බව පෙනේ. යැපීම සඳහා දීමනාවක් ගෙවන ලෙසැ පියවරුනට බල කරන නීති ඉතා තදින් ක්‍රියාවේ යෙදෙනු අප දැකැ තිබේ. එය ඉතා හොඳ සාධාරණ තීරණයක් බව පිළිගත යුතු යැ.

මේ අයුරින් මැ, තම ලේ කිරි කරැ පොවා, එතැන් පටන් අපමණ අයුරු කැප කිරීම් කරැ, ලොවට මුදා හරින සෑම දරුවකේ මැ සිය මව ගැන ද සලකා බැලියැ යුතු යැ යන නීතියක් කරළියට නො පැමිණියේ ඇයි ද යනු මට නම් මහත් කුතුහලයෙකි.

ඇත්ත, යුක්තිය, සාධාරණත්වය ගැන කතා කරන විටැ, තථාගත බුදු හිමියන් දී ඇති ඔවදන් දෙසැ නෙත් යොමා බැලීම බුදුනු අපට හොඳ මැ පිළිවෙත යැ. බුදුන් වහන්සේ විසින් සිය අනුගාමික සඟ රුවන වෙතැ බොහෝ පිළිවෙත් පනවා තිබෙන බව



සිරිවිමල මුතුකුමාරණ
ඩැන්ඩිනොං

අපි දනිමු. ඒ අතරැ, පිඬු සිඟා වඩින බුදු සව්වෙකුට පිඬු සිඟා යාමේ දී තමා ලද අහරින් කොටසක් සිය අනාථ මවට දී, මවගේ කුසගිණි නිවීමට බුදුන් වහන්සේ විසින් පැහැදිලි ලෙසැ අවසර දී ඇති බව ප්‍රචලිතයැ. මෙම උතුම් ආදර්ශය මුළු මහත් සමාජය සහ සෑම නීති පද්ධතියක් විසින් ද අනුගමනය නො කිරීමට හේතුවක් ඇතැයි අපට නම් නො හැඟේ. එහෙත් එය සිදු වී ඇත්තේ නැත.

මෙම හිදැස නිසා, ලොකු මහත් වූ දරුවන් රස මස'වුලෙන් යුත් ප්‍රණීත ආහාර ගනිද්දී, වීදි ගානේ හිඟමනේ යන මව්වරු කොතෙකුත් සිටිති. එම මව්වරුන් තම දරුවන් හැදීමට පුද කරන ලද මව්කිරි බිඳක් සඳහාවත් යමක් ආපසු ඔවුනට ද ලැබියැ යුතුයැ යි නීති පොතට නො ගියේ ඇයි ද යනු අපට නම් සිතා ගනු බැරි යැ.

කිරිල්ලියක් කූඩුව හදන සැටි ඔබ දැකැ ඇතැයි මම සිතමි. කූඩුව නිම වූ පසු එහි බිත්තර ලන කිරිල්ලිය තම අහර සොයා යන ගමන පවා සීමා කරැ, බිජු රැකීමෙන් පසු බිහි වෙන කුරුළු පැටවුන් ලොකු මහත් වන තෙක්මැ පිටතින් අහර ගෙනැවුත් පැටවුන් පෝෂණය කරයි. හැදී වැඩුණු කුරුළු පැටව් කූඩුවෙන් ඉගිලී ගිය පසු ඔවන් සිය දෙමාපියන් ගැන සොයන සිරිතක් නැත. අපගේ මිනිස් සමාජයේ සිටින බොහෝ දෙනා ද මෙම නො මිනිස් (තිරිසන්) ගතිය හුරු කරැ ගත්තේ ද යනු අප ගේ සිතට නැඟෙන වාර බොහෝ යැ. එහෙත්, එය එදා සිටැ මෙදා දක්වාත්, මෙදා සිටැ සදාකාලිකවත් මෙසේ මැ පැවැතී යන්නේ ඇයි ද යනු මට නම් සිතා ගනු බැරි යැ.

මිනිසුන් විසින් අනේක විධ දානයන් දෙන සැටි අප අසා-දැකැ තිබේ. මිනිස් වර්ගයාට දන් දීමෙන් සෑහීමට පත් නොවන ජනයා බලු-කපුටු දාන පවා දෙන සැටි අසන්නට ලැබේ. එහෙත් දරුවන් හදා-වඩා ලොකු-මහත් කරැ, සමාජයට පුදන මව්වරුන්ට දන් දීමක් සුදුසු තරමට තව මැ සැකැසී ඇති බවක් නොපෙනේ. වැඩිහිටි නිවාස ක්‍රමය යහපත් ප්‍රවණතාවයෙකි. එහෙත්, එවැනි තැන්වලට ඇතුල් වීම ලෙහෙසි පහසු දෙයක් සේ නො පෙනේ. එමනිසා, දරුවන් හැදූ-වැඩූ එක ද මවක් තම අහර පත සඳහා හිඟමනේ නො යන දිනයක් කවදා හෝ උදාවුව හොත් එය මිනිස් බවට පිදෙන උපහාරයක් සේ දකිමු.

*අම්මාවරුනේ*
*දරුවනට සමා වුව මැනවි.*

## පාළි පාඨ හෙළ බසින් - 52

''තේසං සම්පන්න සීලානං
අප්පමාද විහාරිනං
සම්මදඤ්ඤා විමුත්තානං
මාරෝ මග්ගං න වින්දති''

(ධම්මපද 57 - පුප්ඵ වග්ග)

අප්පමාදී වැද සිල්වත් වැද
විමුක්තිය හඳුනා ගත්
උතුමන් වඩින මඟ
මරුට නො දැනේ කිසිවිටැ

**සිරිවිමල මුතුකුමාරණ**
ඩැන්ඩිනොං

For all your Adevertising needs
Mihirie Dissanayake
0414 546 833
mihirie@pahana.com.au